# ස්වභාවික සාධක විකෘති කිරීම

ධනේෂ් විසුම්පෙරුම

ශ්‍රී ලංකාවේ භූ විෂමතා පිහිටීම් හා පාරිසරික ලක්ෂණ ගණනාවක් මෙරට ජනප්‍රවාද අතර රාමායණයට සම්බන්ධ කර දක්වා තිබේ. මෙම පත්‍රිකාව ඉදිරිපත් කරන්නේ මේ ජනප්‍රවාද සඳහා විද්‍යාත්මක පැහැදිලි කිරීමක් ලබා ගැනීමට උත්සාහ කිරීමයි.

මෙරට ප්‍රදේශ ගණනාවක දැකිය හැකි කැපී පෙනෙන කඳු ගණනාවක් හනුමාන් විසින් හිමාලයෙන් මෙරටට ගෙන එන ලද කන්දක කොටස් ලෙස විශ්වාස කෙරේ.

එවැනි ස්ථාන අතර වෙනත් ඒ සඳහා ඓතිහාසික සාධක කිසිත් නැත. භූ විද්‍යාත්මකව මෙම කඳු නිර්මාණය වී ඇත්තේ ප්‍රාග් කේම්බ්‍රීය යුගයේය. ( වසර මිලියන 542-4500 ට පෙර) ජන විශ්වාස වලට අනුව මේ ස්ථාන වල දැකිය හැකි වෘක්ෂලතාදිය හිමාලය ප්‍රදේශයට සම්බන්ධයක් ඇති බව සඳහන් වෙතත් විද්‍යාත්මක සාධක අනුව එවැන්නක් සම්බන්ධයක් නොමැත. මෙම ස්ථාන වල දැකිය හැකි ශ්‍රී ලංකාවට ආවේණික ශාක විශේෂ ප්‍රමාණය මේ ස්ථානයේ ශාක ශ්‍රී ලංකාවේ වෘක්ෂලතා වලට සම්බන්ධයක් ඇති බව ද පෙන්වයි.

ඉන්දියාවේ පම්බන් දූපතත් මන්නාරම් දූපතත් අතර පිහිටි "ආදම්ගේ පාලම" නම් වූ දූපත් හා වෙනස්වන වැලි පර සම්බන්ධිත ප්‍රදේශ රාම විසින් ලංකාව ආක්‍රමණය කළ අවස්ථාවේ හනුමා විසින් ගොඩ නැගූ පාලම ලෙසට විශ්වාසයක් ඇත. මේ දූපත් හා වෙනස් වන වැලිපර ස්වභාවිකව පිහිටියක් බව සියළු පිළිගත් විද්‍යාඥයන් විසින් තහවුරු කර ඇත.

රාමායණ මිථ්‍යා සංචාරය සමග සම්බන්ධ කර ඇති උස්සන්ගොඩ රාවණගේ ගුවන් තොටුපලක් ලෙස පැවති බවත් හනුමා විසින් පසුව ගිනි තැබූ බවත් ජනප්‍රවාද වල සඳහන් වේ. භූ විද්‍යාත්මකව මෙය සර්පන්ටයින් පාෂාණයෙන් සැදුනු අතර මතුපිට රතු පසින් වැසී පවතී. මෙය පසෙහි බැර ලෝහ ඇතුළු මූලද්‍රව්‍ය ගණනාවක් අධික සාන්ද්‍රණයකින් ඇතුළත්ය. මෙවැනි පරිසරයක වැඩෙන්නේ එවැනි බැර ලෝහ සඳහා ඔරොත්තු දිය හැකි ශාක විශේෂ පමණි. මෙවැනි ස්ථාන වල දැකිය හැකි අඩු ශාක විවිධත්වයට හේතුව එයයි. මෙවැනි පාංශු තත්ව සහිත ස්ථාන ලංකාවේ තවත් ඇති අතර වස්ගමුවේ පිහිටි යුධගනාව එවැනි ස්ථානයකි.

එක් විශ්වාසයකට අනුව මාරත්මල් පුෂ්පය සීතාගේ රැඳී සිටීමට සාක්ෂයක් ලෙස සඳහන් කෙරේ. ඊට සාධක ලෙස ගැනෙන්නේ මේ පුෂ්පය ඉතා සීමිත ප්‍රදේශයක දැකිය හැකි වීමය. එහෙත් මේ ශාකය යෝග්‍ය වූ දේශගුණික තත්ව සහිත උස් කඳුකර කලාපීය වනාන්තර හා පතන බිම් ආශ්‍රිතව දැකිය හැකි සුලබ ශාකයකි.

රාමායණ සංචාරය පතුරවන්නන් විසින් සඳහන් කරන පරිදි මධ්‍ය කඳුකර කඳු මුදුන් ආශ්‍රිත වෘක්ෂලාතාදිය වලින් තොර ප්‍රදේශ පිහිටා ඇත්තේ රාමායණයට සම්බන්ධයක් ඇති නිසා නොව භූ දේශගුණික තත්ව නිසාය.